# වැදගත් තොරතුරු ලේඛනය

DFCC බැංකුව පී එල් සී විසින්, සිය පාරිභෝගික ප්‍රජාව වෙත පිරිනමනු ලබන බැංකුකරණ සේවාවන් හා අදාළ වන විශේෂාංග සහ ඒවායෙහි පවතින සුවිශේෂීතාවන්ගෙන් මෙම තොරතුරු ලේඛනය සමන්විත වේ. අවශ්‍ය ඕනෑම විටෙක මෙහි සඳහන් කර ඇති අදාළ කොන්දේසි සහ එකඟතාවන්, ගාස්තු සහ අයකිරීම් වෙනස් කිරීමේ හෝ ඉවත් කිරීමේ හෝ අයිතිය බැංකුව සතුවේ. මෙම වැදගත් තොරතුරු ලේඛනය පාරිභෝගිකයා වෙත ලබා දෙනුයේ, 2011 අංක 8 නියෝගය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද වාණිජ්‍ය බැංකු සඳහා වන පාරිභෝගික ප්‍රඥප්තියට අනුකූල වන පරිද්දෙනි.

## 1.0 නිෂ්පාදන සහ සේවාවන්

ශ්‍රී ලාංකික වාණිජ්‍ය බැංකුවක් ලෙස පහත සඳහන් මූල්‍ය පහසුකම් සහ සේවාවන් අපි අපගේ පාරිභෝගික ප්‍රජාව වෙත තිළිණ කරන්නෙමු.

| පහසුකම / සේවාව | විස්තරය |
|---|---|
| ව්‍යාපෘති ණය | DFCC බැංකුව විසින් නව ව්‍යාපාර ආරම්භයේ මූලික අවධියේදී, පවතින ව්‍යාපාර ව්‍යාප්ත කිරීමේදී හෝ නවීකරණය කිරීමේදී ව්‍යාපෘති ණය හිමිකර දෙනු ලැබේ. එසේ ණය හිමිවන ප්‍රධාන ක්ෂේත්‍රයන් වන්නේ කෘෂි කාර්මික ක්ෂේත්‍රය, වන විද්‍යා සහ ධීවර, ආහාර පාන නිෂ්පාදනය, විදුලි බල ජනනය, වායු සහ ජල ව්‍යාපෘති, ඉදිකිරීම්, අලෙවිකරණය, හෝටල් සහ අවන්හල්, ප්‍රවාහනය, ගබඩා කිරීම් සහ සන්නිවේදනය, මූල්‍ය, රක්ෂණ, දේපළ සංවර්ධන සහ ව්‍යාපාර සේවා ආදී ක්ෂේත්‍ර රාශියකි. |
| ක්‍රියාකාරී ප්‍රාග්ධන ණය | ව්‍යාපාර සඳහා මූල්‍ය ස්ථාවර ක්‍රියාකාරී ප්‍රාග්ධන අවශ්‍යතා වෙනුවෙන් මධ්‍යම පරිමාණ සහ දීර්ඝ කාලීන වශයෙන් මූල්‍ය පසුකම් හිමිවේ. |
| ලීසිං පහසුකම් | ව්‍යාපාරික උනන්දුවක් ඇති, දියුණු විය හැකි පාරිභෝගිකයින් සඳහා මූල්‍යමය ලීසිං පහසුකම් ද තනි පුද්ගල සහ වෘත්තිකයින් වෙනුවෙන් වාහන සඳහා මූල්‍යමය ලීසිං පහසුකම් හිමිවේ. තවද, තෝරාගත් මැෂින් යන්ත්‍ර වර්ග සඳහා යන්ත්‍රෝපකරණ සහ උපාංග ආදිය මිලදී ගැනීම සඳහා ද බැංකුව වෙතින් ලීසිං පහසුකම ලබා ගත හැකිය. |
| ඇපකාරක පහසුකම් | විවිධාංගීකරණය වූ බැංකු ඇපකාරක සේවාවන් රැසක් අප විසින් සපයනු ලබයි. බැඳුම්කර වෙන්දේසි, අත්තිකාරම් ගෙවීම්, කාර්ය සාධන බැඳුම්කර, සාමාන්‍ය ව්‍යාපාර වෙනුවෙන් වූ භාණ්ඩ මිලදී ගැනීම් ණය සඳහා වන ඇපකාරක සේවාවන් ආදිය මින් ප්‍රධානය. |

| | |
|---|---|
| පුද්ගල ණය | රජයේ සහ පෞද්ගලික අංශයේ ස්ථිර සේවයේ නියුතු පිරිසගේ පුද්ගලික අවශ්‍යතාවන් සම්පූර්ණ කර ගැනීම මූලික ඉලක්කය කර ගනිමින් පිරිනමන පුද්ගල ණය සේවාවකි. එසේම වෘත්තිකයින් සහ ව්‍යාපාරික ප්‍රජාව වෙනුවෙන් සැකසූ විවිධාංගීකරණය වූ පුද්ගල ණය ක්‍රමවේද අප සතුවේ. අපගේ මෙම පුද්ගල ණය සේවාව මගින් යම් පුද්ගලයෙකුගේ නිවාස සංවර්ධන කටයුතු, වාහන මිලදී ගැනීම්, දරුවන්ගේ අධ්‍යාපන අවශ්‍ය සපුරා ගැනීම මෙන්ම වෙනත් ඕනෑම පුද්ගලික අවශ්‍යතාවක් සපුරා ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් සපයා දෙනු ලැබේ. |
| ව්‍යාපාර මූල්‍ය පහසුකම් | DFCC බැංකුව විසින් ආනයන සහ අපනයන වෙළෙඳාම් සිදු කරනු ලබන අන්තර්ජාතික වෙළෙඳාම හා සම්බන්ධ ව්‍යාපාරයන් සහ තනි පුද්ගලයන් වෙනුවෙන්ම සැකසූ සුවිශේෂී සේවාවන් රැසක් තිළිණ කරනු ලබයි. ආනයන මූල්‍ය අංශයේදී ණය ඉල්ලුම් ලිපි සම්පාදනය, වාර්තා එකතුවන් හැසිරවීම, නාවික ඇපකරුවන් නිකුත් කිරීම, ආනයන ණය සඳහා මුදල් යෙදවීම් ආදිය ද අපනයන මූල්‍ය පහසුකම් සපයනුයේ පෙර හා පසු නැව්ගත කිරීම් මූල්‍ය කටයුතු සඳහා, ණය වෙනුවෙන් අපනයන උපදෙස් ලිපි, මිලදී ගැනීම්/ මිල සාකච්ඡා කිරීම් ණය හා අදාළ ලිපි සහ එකතු කිරීමේ බිල්පත් ආදිය සඳහාය. |
| උකස් සේවාව | අපගේ සේවාදායකයින් මුහුණ දෙන හදිසි මුදල් අවශ්‍යතාවකදී ඒවා සුපරා ගැනීම සඳහා ඔවුන්ගේ රත්‍රන් සහ රන් ආභරණ උකස් කිරීමේ පහසුකම. |
| නිවාස ණය | DFCC බැංකුව විසින් හිමිකර දෙන නිවාස ණය මගින් දේපළ මිලදී ගැනීම, නිවාස ඒකක සහ අනුනිවාස (apartments), නව නිවෙසක් ඉදිකිරීම, පවතින නිවසේ අලුත්වැඩියා කටයුතු සඳහා හෝ කොටස් එකතු කිරීම සඳහා ආදී වූ අවශ්‍යතා රාශියක් ඉටු කර ගැනීමේ අවස්ථාව පාරිභෝගිකයා වෙත තිළිණ කරයි. ඔවුන්ගේ අවශ්‍යතාව පරිදි නැවත ගෙවීමේ කාලසීමාවන් තීරණය කර ගත හැකි සේම ස්ථාවර හෝ විචල්‍ය පොලී අනුපාතයක් ද තීරණය කරගත හැකිය. |
| බැංකු අයිරාවන් | මෙම පහසුකම හිමිවන්නේ ව්‍යාපාරික හිමිකරුවන් හට ඔවුන්ගේ ව්‍යාපාරවල දෛනික ක්‍රියාකාරී ප්‍රාග්ධන අවශ්‍යතාවන් සපුරා ගැනීම වෙනුවෙනි. |
| ක්‍රෙඩිට් සහ ඩෙබිට් කාඩ් පහසුකම | DFCC VISA ඩෙබිට් කාඩ්පත භාවිතයෙන් ලොව පුරා VISA බලයලත් වෙළෙඳ ආයතනවලින් භාණ්ඩ හා සේවාවන් මිලදී ගැනීම සඳහා මෙන්ම ලොවපුරා VISA ATM ජාලය භාවිතයෙන් මුදල් අපසු ගැනීම ද සිදු කළ හැකියි.<br><br>එසේම DFCC බැංකුව විසින් පිරිනමනු ලබන VISA ක්‍රෙඩිට් කාඩ් (ක්ලැසික්, ගෝල්ඩ්, ප්ලැටිනම්) වෙනුවෙන් සුවිශේෂී ප්‍රතිලාභ රැසක් තිළිණ කරයි. සංස්ථාපිත සේවාදායකයින් වෙනුවෙන් |

| | |
|---|---|
| | සංස්ථාපිත ක්‍රෙඩිට් කාඩ්පත් ද අප විසින් නිකුත් කරනු ලබන්නෙමු. |
| බැරකම් සේවාවන් (Liability products) | පාරිභෝගිකයාගේ අවශ්‍යතාව අනුව සුවිශේෂීව, ගැලපෙන අයුරින් සකසන ලද, පුළුල් පරාසයක විහිදී ගිය ඉතුරුම් ගිණුම් රාශියක් DFCC බැංකුව තිළිණ කරයි.<br>ජංගම ගිණුම<br>ඉතුරුම් ගිණුම<br>ස්ථාවර තැන්පතු<br>ළමා ඉතුරුම් ගිණුම<br>ජ්‍යේෂ්ඨ පුරවැසි ගිණුම<br>අනේවාසික ඉතුරුම් ගිණුම<br>නේවාසික ඉතුරුම් ගිණුම |
| අන්තර්ජාල බැංකුකරණ පහසුකම | අපගේ අන්තර්ජාල බැංකුකරණ පහසුකම පාරිභෝගිකයා වෙත හිමිකර දෙන්නේ ඕනෑම වේලාවක, ඕනෑම තැනක හිඳ තමන්ගේ ගිණුම වෙත පිවිස සියලුම බැංකුකරණ කටයුතු වඩා සුවපහසුවෙන් සිදු කිරීමේ සුරක්ෂිත, වේගවත් මෙන්ම කාර්යක්ෂම ක්‍රියාවලියකි. මෙම සේවාවන් අතර ගිණුම් ශේෂය විමසීම, බිල්පත් ගෙවීම්, ණය වාරික ගෙවීම් පිළිබඳ විමසීම් සඳහා අයදුම් කිරීම ආදිය ඉන් ප්‍රධාන වේ. |
| බැංකු රක්ෂණ සේවා සැපයීම | මෙම බැංකු රක්ෂණ සේවා මගින් ඔබට අවැසි රක්ෂණාවරණයන් ඉතාම පහසුවෙන් හිමිකර ගැනීමේ අවස්ථාව උදාවේ. දිවයින පුරා පිහිටි අපගේ ශාඛා ජාලය මගින් තනි පුද්ගල සහ සමාගම් පාරිභෝගිකයින් වෙනුවෙන් වන රක්ෂණ විසඳුම් රාශියක් සපයා දෙනු ඇත. |
| විදේශ මුදල් ගනුදෙනු | RFC, NRFC, EFC, RNNFC, SFIDA ආදී වූ ගිණුම් හා අදාළ විදේශ මුදල් මූලික කරගත් ගනුදෙනු සියල්ලක්ම පාහේ සිදු කිරීමේ අවස්ථාව පාරිභෝගිකයා වෙත හිමිවේ. බැංකුවේ නිර්ණායකයන්ට අනුකූලව විදේශ මුදල් ණය හිමිකර ගැනීමේ අවස්ථාවද පරිභෝගිකයන් හට හිමිවේ. පිටස්තරව, පිටරට සිට ලංකාවට එවන මුදල් විදුලි ලිපි හවමාරු ක්‍රම මගින් ද අභ්‍යන්තරව පිට රට සිට ලැබෙන මුදල් ලංකා මනි ට්‍රාන්ස්ෆර් සහ වෙස්ටර්න් යූනියන් මගින් ද DFCC බැංකුවේ බලයලත් නියෝජිත ආයතනයකට බැර කළ හැකියි. |
| බිල්පත් / රක්ෂණ වාරික ගෙවීමේ පහසුකම | අපගේ දීප ව්‍යාප්ත ශාඛා ජාලය ඔස්සේ සියලුම සේවාදායකයින් හට විදුලි, ජල බිල්පත් සහ SLT, Dialog, Mobitel, Lanka Bell ආදී දුරකථන බිල්පත් ඉතා පහසුවෙන් ගෙවීමේ අවස්ථාව හිමිවනවා. Sri Lanka Insurance,47 Ceylinco Insurance, Union Assurance සහ AIA insurance ආදී රක්ෂණ ආයතනවල රක්ෂණ වාරික ගෙවීමද දැන් පහසුවෙන් සිදු කළ හැකියි. |
| ණය සම්මේලකය | සම්මේලයක ණයක් යනු ණය දායකයින් සමූහයක් විසින් සපයනු ලබන ණය පහසුකමකි. එමෙන්ම, එය තනි බැංකුවක් හෝ |

| | |
|---|---|
| | බැංකු කිහිපයක් විසින් ව්‍යුහගත කරමින් සකස් කොට පරිපාලනය කරනු ලබන පහසුකමකි. මෙම ණය සම්මේලකය සපයනු ලබන්නේ සාමාන්‍ය සංස්ථාපිත සමාගම්වල ප්‍රාග්ධන වියපැහැදම්, ක්‍රියාකාරී ප්‍රාග්ධන මූලයන් සහ ප්‍රාග්ධන ව්‍යාප්ත කිරීම් ආදී මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීමටයි. |
| උපදේශන සේවාවන් | මෙම පහසුකම පාරිභෝගික ප්‍රජාවගේ ව්‍යාපාර හෝ සමාගම්හි වර්තමාන සහ අනාගත ව්‍යාපාරික අපේක්ෂාවන් ඉටුකරගැනීම වෙනුවෙන් හිමිකර දෙන්නකි. මෙම සේවාව ඔස්සේ ව්‍යාපාරය හා අදාළ නීතිමය පසුබිම අධීක්ෂණය, බදු, මූල්‍ය පාලනය, වෙළෙඳපොළ සහ එහි ඇති අවදානම් තත්ත්වයන් පිළිබඳ උපදේශනය සහ පවතින ව්‍යාපාර සඳහා යෝග්‍ය නව වෙනස්කම් ආදිය පිළිබඳ මනා උපදේශනයක් ලබා දෙයි. |

## 2.0 පොලී අනුපාත සහ කොමිස් මුදල්

සෑම ව්‍යාපාරික ඒකකයක් සමගම අදාළ වන පොලී අනුපාතයන් සහ කොමිස් මුදල් අනුපාතයන් සමාරෝපනය කෙරේ. මෙම තොරතුරු මෙලෙසින්ම අපගේ වෙබ් අඩවිය වන www.dfcc.lk හි අන්තර්ගත කොට තිබේ.
කාලයෙන් කාලයට, පවතින වෙළෙඳපොළ තත්ත්වයන් මත පදනම්ව අපගේ පොලී සහ කොමිස් මුදල් අනුපාත සංශෝධනය විය හැකිය.

## 3.0 ගාස්තු සහ වෙනත් අයකිරීම්

කරුණාකර මෙහි අමුණා ඇති DFCC බැංකුවේ අදාළ ගාස්තු සහ අයකිරීම් ලේඛනය විමසා බලන්න. (වැඩිදුර විමර්ෂණය සඳහා වැදගත් වන DFCC බැංකුවේ තොරතුරු ලේඛනය සහ ගාස්තු ලේඛනය අපගේ www.dfcc.lk යන වෙබ් අඩවියේ අන්තර්ගත කර තිබේ.)

## 4.0 DFCC බැංකුවේ මූල්‍ය පහසුකම් සහ සේවාවන් හිමිකර ගැනීම හා අදාළ ක්‍රියා පිළිවෙළ

හැකියාවන්ගෙන් පිරිපුන් සියලුම පාරිභෝගික භවතුන් අපගේ ප්‍රධාන ශාඛාව වෙත හෝ ළඟම පිහිටි බැංකු ශාඛාව වෙත සාදරයෙන් පිළිගනු ලබන අතරම එහි පැමිණි ඔබ හට ඔබේ අවශ්‍යතාවන්, අපගේ කළමනාකාරීත්වය සමග නිසි පරිදි සාකච්ඡා කළ හැකියි. එම කතාබහෙන් අනතුරුව, හැකියාවන් ඇතැයි බැංකුව විසින් තීරණය කරනු ලබන පාරිභෝගිකයින් වෙත, මූල්‍ය පහසුම් සහ සේවාවන් ලබා ගැනීම හා අදාළ අයදුම් පත්‍ර කළමනාකාරීත්වය විසින් ලබා දෙනු ඇත. නිවරදිව සම්පූර්ණ කරනු ලැබූ අයදුම්පත බැංකුව වෙත ලැබුණු විගස අදාළ පාරිභෝගිකයා විසින් අයදුම්

කර ඇති මූල්‍ය පහසුකම හෝ සේවාව ඇගයීමට ලක්කොට එම අවශ්‍යතාව සපුරාලීමේ ඉදිරි පියවර ක්‍රියාත්මක කරනු ඇත.

## 5.0 ප්‍රධාන කොන්දේසි සහ නියමයන්

පොලී අනුපාත, කොමිස් අනුපාත, ගාස්තු අයකිරීම්, ණය මුදල් ප්‍රමාණය, සහන කාලය, ආපසු ගෙවීම් කාලසීමාව, සමපාර්ශ්වික අවශ්‍යතාවන් සහ අනෙකුත් සුවිශේෂී කොන්දේසි සහ නියමයන් ආදී ප්‍රධාන කොන්දේසි සහ නියමයන් ව්‍යාපෘතියෙන් ව්‍යාපෘතියට සහ සේවාවෙන් සේවාවට අනුව වෙනස් විය හැකිය.

## 6.0 පාරිභෝගික පැමිණිලි බේරුම් කිරීමේ ක්‍රියා පිළිවෙළ

අපගේ සේවක මණ්ඩලය මේ වෙනුවෙන් ඉතාම හොඳින් සූදානම් වී සිටින අතරම වඩාත් කාර්යක්ෂම සහ ඵලදායී මෙන්ම මිත්‍රශීලී, ඉක්මන් සේවාවක් පාරිභෝගිකයා වෙත හිමිකර දීමට සැදීපැහැදී සිටියි. සෑම පාරිභෝගිකයකුටම සෑම අවස්ථාවකදීම කාර්යක්ෂම මෙන්ම සඵලදායී සේවාවක් හිමිකර ගැනීමට ඇති අයිතිය වෙනුවෙන් DFCC බැංකුව සැමවිටම ගෞරව පූර්වක ලෙස ඇපකැප වෙයි. කෙසේ නමුත්, යම්හෙයකින් හෝ ඔබ නොසතුටු මෙන්ම තත්ත්වයෙන් පහළ අන්දමේ සේවාවක් හිමි වූයේ යැයි සිතන්නේ නම්, පහත සඳහන් කර ඇති අපගේ නිලධාරීන් වෙත ඔබගේ පැමිණිල්ල එක්කෝ ලිඛිතව බාරදිය හැක. නැත්නම්, වාචිකව හෝ ඉදිරිපත් කළ හැකිය.

| | |
|---|---|
| ණය සම්බන්ධ ගැටළු<br>තිමාල් පෙරේරා මහතා<br>නියෝජ්‍ය ප්‍රධාන විධායක නිලධාරී,<br>DFCC බෑන්ක් පීඑල්සී,<br>73/5, ගාලු පාර,<br>කොළඹ 03.<br>දු.ක : 0112 442 458<br>ඊ මේල් - thimal.perera@dfccbank.com | මෙහෙයුම් සම්බන්ධ ගැටළු<br>අචින්ත හේවානායක මහතා<br>ප්‍රධාන මෙහෙයුම් නිලධාරී<br>DFCC බෑන්ක් පීඑල්සී,<br>73/5, ගාලු පාර,<br>කොළඹ 03.<br>දු.ක : 0112 371 457<br>ඊ මේල් - achintha.hewanayake@dfccbank.com |

ඉහත නිලධාරීන් වෙත ලැබුණු පැමිණිලි සටහන් කළ බව දන්වා එවනු ලැබේ. වැඩකරන දින 7ක් ඇතුළත පැමිණිල්ල හා අදාළ පාරිභෝගික භවතුන් සියලු දෙනා වෙත සිදු කරන ලද විමර්ශණ සහ ක්‍රියාමාර්ග පිළිබඳව දැනුවත් කරනු ඇත.

## 7.0 ණය ආපසු අයකර ගැනීමේ ක්‍රියා පිළිවෙළ

පාරිභෝගිකයින් වෙත ලබාදුන් ණය පහසුකම් හා අදාළ ආපසු ගෙවීම් සියල්ල නැවත අය කර ගැනීමට බැංකු විසින් හැකි සෑම උත්සාහයක්ම දරනු ඇත. එක් එක් සිදුවීම හා අදාළව බැංකුවේ සමස්ත ණය නිකුත් කිරීමේ පිළිවෙත අනුව පාරිභෝගිකයාට එම අවස්ථාවේ දැරිය හැකි, එසේම ගෙවිය හැකි මුදල් ප්‍රමාණයන්ට අනුකූල වන පරිදි ණය වාරික නැවත් සකස් කිරීමට සහ ප්‍රති ව්‍යුහගත කිරීමට බැංකුව කටයුතු කරනු ඇත. එවන් අවස්ථාවන් සලසාදී තිබියදීත් පාරිභෝගිකයා ණය මුදල අදාළ පරිදි නැවත ගෙවීමට අපොහොසත් වුවහොත් ව්‍යවස්ථානුකූල ණය අයකරවා ගැනීමේ නියෝග සඳහා වන 1999 පනත් අංක 2 සිවිල් පිටිපාටි සංග්‍රහය යටතේ සහ නැවත භුක්තිය හිමිකර ගැනීම සහ බේරුම්කිරීම් ආදී වූ වෙනත් ක්‍රියා පිළියම් අනුගමනය කිරීමට බැංකුව කටයුතු කරනු ඇත.

යම් ණය මුදලක් දේපළ උකස් කර ගැනීමක් මගින් හිමිකරගෙන ඇත්නම් බැංකුව විසින් නීතිමය ක්‍රියාමාර්ගයකට යොමු වන අතර ගෙවීමට ඇති සම්පූර්ණ හිඟ මුදල් එනම් බැංකුව විසින් ලබාදුන් මුළු ණය මුදලම අදාළ ව්‍යවස්ථානුකූල නියෝගයන්ට අනුකූලව නැවත අය කර ගැනීම වෙනුවෙන් (විශේෂ ව්‍යයස්ථානුකූල නියෝග) පනත් අංක 4 1990 සහ උකස්කිරීම් හා අදාළ පනත් අංක 6 1949 යන නීතිමය රාමුව ඔස්සේ අය කර ගනු ලබන අතර මෙම ක්‍රියාමාර්ග සඳහා බැංකුව වෙනුවෙන් සිදුවන වෙනත් වියදම් සියල්ලම අදාළ පාරිභෝගිකයා විසින් දැරිය යුතු වේ.

බැංකුව විසින් ගනු ලබන එවන් වූ නීතිමය ක්‍රියා පිළිවෙත්වල වගකීම පාරිභෝගිකයා විසින් දැරිය යුතුය.

## 8.0 අනාවරණය කිරීම්

1998 අංක 30 දරන බැංකුකරණ පනත යටතේ 77 කාණ්ඩය අනුව ඇති ව්‍යාවස්ථානුකූල නියෝගවලට යටත්ව බැංකුව සහ පාරිභෝගිකයා හා බැංකුව විසින් සිදු කරනු ලබන මූල්‍යමය ගනුදෙනුවල රහස්‍යභාවය ගෞරවයෙන් යුතුව ආරක්ෂා කිරීමට බැංකුව තරයේ කටයුතු කරනු ඇත.

## 9.0 2006 අංක 6 දරන පනතට අනුකූලව මූල්‍යමය ගනුදෙනු වාර්තා කිරීම

යම් නීතිවිරෝධී මූල්‍ය ගනුදෙනුවක් හෝ එවැනි උත්සාහයක් හෝ කිසියම් මූල්‍ය සාපරාධී ක්‍රියාවක් පිළිබඳව බැංකුව වෙත සැක පහළ වුවහොත් සහ ඒ සඳහා සැලකිය යුතු මට්ටමේ හේතු සාධක පවතී නම් 2006 මූල්‍ය ගනුදෙනු වාර්තා පනත් අංක 6 කාණ්ඩ අංක 7 යටතේ ඇති ව්‍යවස්ථානුකූල නියෝගයන්ට අනුව, බැංකුව විසින් එම ක්‍රියාවලිය පිළිබඳව මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කළ යුතුය.

## 10.0 කල් නොපිරුනු මුදල් ආපසුගැනීම් සහ අවසන් කිරීම් වෙනුවෙන් හානිපූරණය

පාරිභෝගිකයකු විසින් සිදු කරනු ලබන කල් නොපිරුනු මුදල් ආපසුගැනීම් සහ අවසන් කිරීම් වෙනුවෙන් දැනට ගෙවීම් කර ඇති සහ ගෙවීම් සිදු කිරීමට ඇති මාස/ අවුරුදු ගණන පදනම් කර ගනිමින් හානිපූරණ අයකර ගැනීම් සිදු කිරීමට බැංකුවට හැකියාව තිබේ.